වැවිලි අමාත්‍යාංශය
பெருந்தோட்ட அமைச்சு
MINISTRY OF PLANTATION

ශ්‍රී ලංකා තේ මණ්ඩලය
இலங்கை தேயிலைச் சபை
SRI LANKA TEA BOARD

574 { ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
காலிவீதி, கொழும்பு 03, இலங்கை
Galle Road, Colombo 03, Sri Lanka }

2021.03.02

චක්‍රලේඛ අංකය - TC/CIR(204)-02-2021

සියළුම මධ්‍ය පරිමාණ (අක්කර 10 ත් 50 ත් අතර) තේ ඉඩම් හිමිකරුවන් වෙත,

**<u>ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය</u>**

**1. හැඳින්වීම**

"සෞභාග්‍යයේ දැක්ම" සංවර්ධන වැඩසටහන යටතේ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම උදෙසා ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය තුළින් මධ්‍ය පරිමාණ තේ වතු අංශයේ නිෂ්පාදනය වර්ධනය කිරීමත්, මධ්‍ය පරිමාණ වතුවල ඵලදායිතාවය වර්ධනය කිරීමත් අරමුණු කර ගනිමින් යහපත් කෘෂි කාර්මික වත් පිළිවෙත් උපයෝගී කරගනිමින් කටයුතු කිරීමට සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා සුදුසුකම් ලත් මූල්‍ය ආයතන 10ක් හරහා ණය පහසුකම් ලබා දෙනු ලැබේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත ක්ෂේත්‍ර පහත පරිදි වේ.

- තේ නැවත වගාව
- තේ අලුත් වගාව
- පාළු සිටුවීම
- තේ වගාවේ ජල සම්පාදනය
- තේ තවාන් සංවර්ධනය
- තේ වගාවේ යාන්ත්‍රීකරණය

1.1 මධ්‍ය පරිමාණ තේ වතු අංශයේ ප්‍රතිලාභින්,
අක්කර 10 ට වඩා වැඩි වපසරියකින් යුත් තේ ඉඩම් හිමි වතු හිමියන්,

1.2 ණය ආපසු ගෙවීමේ කාල සීමාව
ණය ආපසු ගෙවීමේ කාල සීමාව වසර 10 කි.

1.3 ණය ආපසු ගෙවීමේදී සහන කාලය

තේ නැවත වගාව හා අළුත් වගාව සඳහා ණය ආපසු ගෙවීමේදී මුළු ණය මුදල ආපසු ගෙවීමේ කාල සීමාවෙන් පළමු වසර දෙකක සහන කාලයක් වශයෙන් ලබා දෙනු ලැබේ.

පාළු සිටුවීම, තේ වගාවේ ජල සම්පාදනය, තේ තවාන් සංවර්ධනය හා යාන්ත්‍රීකරණයට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ණය ආපසු ගෙවීමේදී මුළු ණය මුදල ආපසු ගෙවීමේ කාල සීමාවෙන් පළමු වසර සඳහා සහන කාලයක් වශයෙන් ලබා දෙනු ලැබේ.

සභාපති / தலைவர் / CHAIRMAN } T : +94 11 2590968 F : +94 11 2585701
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / DIRECTOR GENERAL } T : +94 11 2508991 F : +94 11 2582122
පොදු දු. අංකය / பொது தொ எண / GENERAL NO. } +94 11 2587814 +94 11 2582121 +94 11 2583687
ෆැක්ස් / தொலைநகல் / FAX NO. } +94 11 2587341 +94 11 2589132

TEA COMMISSIONER T : +94 11 2580182 F : +94 11 2580161 tcd@pureceylontea.com
TEA PROMOTION T : +94 11 2583343 F : +94 11 2587341 promotion@pureceylontea.com
ADMINISTRATION T : +94 11 2586053 F : +94 11 2589132 teaboard@pureceylontea.com
FINANCE T/ F : +94 11 2580162 finance@pureceylontea.com
ANALYTICAL LABORATORY T/ F : +94 11 2581576 lab@pureceylontea.com

Web : www.pureceylontea.com / www.srilankateaboard.lk

1.4 ලබාගත හැකි උපරිම ණය මුදල -

ව්‍යාපෘතිය යටතේ ලබාගත හැකි උපරිම ණය මුදල රුපියල් මිලියන 30ක් වන අතර උපරිම ණය සීමාව යටතේ එක් ණය ඉල්ලුම්කරුවෙකුට ව්‍යාපෘති කිහිපයකට ණය පහසුකම් ලබා ගත හැක.

1.5 පොලී අනුපාතය

ණය යෝජනා ක්‍රමය යටතේ ණය පොලී අනුපාතය **4.5% - 5%** ත් වන අතර මෙම පොලී අනුපාතය වෙළඳපොල තත්ත්වයන් මත පදනම්ව සෑම මාස 06කට වරක්ම යාවත්කාලීන වනු ඇත. කෙසේ වුවද කිසියම් ණය ඉල්ලුම්කරුවෙකුගේ ණය මුදලක් අනුමත කිරීමේදී මූල්‍ය ආයතනය හා ණයකරු අතර එකඟවන පොලී අනුපාතය එම ණය මුදල ගෙවා අවසන් වන තුරු නොවෙනස්ව පවතී.

1.6 ණය පහසුකම් සපයන මූල්‍ය ආයතන
ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, DFCC බැංකුව, සෙලාන් බැංකුව, සම්පත් බැංකුව හා නේෂන් ට්‍රස්ට් බැංකුව.

1.7 ණය මුදල් නිදහස් කිරීම

ණය මුදල් නිදහස් කිරීමේදී අදාළ ණය පහසුකම් සපයන ආයතන විසින් ඉදිරිපත් කරන ණය වාරිකය නිර්දේශ කිරීමට අවශ්‍ය පෝරමය හා ණය ඉල්ලුම්කරු විසින් මූල්‍ය ආයතනය වෙත ඉදිරිපත් කරන ලද ණය ඉල්ලුම් පතෙහි පිටපතක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයන්හි සහකාර තේ කොමසාරිස්වරුන් වෙත ලබා දුන්පසු තේ උපදේශක/පරීක්ෂක විසින් නිර්දේශ කර ප්‍රාදේශීය සහකාර තේ කොමසාරිස්වරුන් විසින් සහතික කොට නැවත ණය පහසුකම් සපයන මූල්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ යුතුය.

| | |
|---|---|
| 01. සහකාර තේ කොමසාරිස්<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය,<br>තේ කොමසාරිස් අංශය,<br>140, අඹගමුව පාර, ගම්පොල.<br>දුර.අංකය/ෆැක්ස් : 081- 2352279 | මහනුවර/මාතලේ දිස්ත්‍රික්ක සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ<br>මාවනැල්ල තේ උපදේශක/පරීක්ෂක කොට්ඨාශය |
| 02 .සහකාර තේ කොමසාරිස්<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය,<br>තේ කොමසාරිස් අංශය,<br>අංක 34, ගංගාරාම හරස් පාර,<br>මාගාල්ල, ගාල්ල.<br>දුර.අංකය/ෆැක්ස් : 091- 2232052 | ගාල්ල දිස්ත්‍රික්කය |
| 03. සහකාර තේ කොමසාරිස්<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය,<br>තේ කොමසාරිස් අංශය,<br>61/1, නව නගරය, රත්නපුර.<br>දුර.අංකය/ෆැක්ස් : 045- 2222136 | රත්නපුර දිස්ත්‍රික්කය /කෑගල්ල දිස්ත්‍රික්කයේ කරවනැල්ල තේ උපදේශක/පරීක්ෂක කොට්ඨාශය |

04. සහකාර තේ කොමසාරිස්
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
තේ කොමසාරිස් අංශය,
අංක 23, අලුත් මාවත,
උයන්වත්ත, මාතර.
දුර.අංකය/ෆැක්ස් : 041- 2222636

මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක

05. සහකාර තේ කොමසාරිස්
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
තේ කොමසාරිස් අංශය,
විශාඛා මාවත, නව බදුල්ල පාර,
බණ්ඩාරවෙල.
දුර.අංකය/ෆැක්ස් : 057- 2222812

බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක

06. සහකාර තේ කොමසාරිස්
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
තේ කොමසාරිස් අංශය,
වතුරාන පාර, බදුරලිය
දුර.අංකය/ෆැක්ස් : 034- 2247444

කළුතර දිස්ත්‍රික්කය සහ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටියතේ උපදේශක/පරික්ෂකකොට්ඨාශය

07. සහකාර තේ කොමසාරිස්
ශ්‍රී ලංකා තේ මණ්ඩය,
තේ කොමසාරිස් අංශය,
අංක 10, නානුඔය පාර, කැලේගාල,
නුවරඑළිය.
දුර.අංකය : 052-2234695
ෆැක්ස් : 052- 2234686

නුවරඑළිය දිස්ත්‍රික්කය

2. **ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය -**

2.1 තේ නැවත වගාව හා අලුත් වගාව සඳහා ණය පහසුකම් ලබාදීම.

තේ නැවත වගාව හා අලුත් වගාව සඳහා ණය පහසුකම් ලබාගත හැකි උපරිම ණය සීමාව හෙක්ටයාරයකට රු. මිලියන 2.5කි. වගා සහනාධාර ලබා ගන්නා ප්‍රතිලාභින්ට සහනාධාර මුදල අඩු කොට ඉතිරි මුදල ණය ලෙස ලබා ගත හැක.

පළමු වාරිකය නිදහස් කිරීම - ණය මුදල් අයදුම්පත අනුමත කළ පසු

දෙවන වාරිකය නිදහස් කිරීම -ක්ෂේත්‍රයේ නිසි ලෙස තේ පැල සිටුවා අවසන් කළ පසු

උදා - මෙම ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාරයකට අනුමත ණය මුදල රු. මිලියන 2.5 කි. සහනාධාර ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලබා දී ඇති මුදල ලක්ෂ 05 ක් වන විට ඉතිරි මුදල රුපියල් මිලියන 02 ක් ණය මුදල ලෙස ලබා ගත හැකි වේ.

2.2 තේ වගාවේ පාළු සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම.

පාළු සිටුවීම සඳහා ණය පහසුකම් ලබාගත හැකි උපරිම ණය සීමාව හෙක්ටයාරයකට රු.400,000/= කි.

2.3 තේ තවාන් සංවර්ධනය සඳහා ණය පහසුකම් ලබාදිම.

තේ තවාන් සංවර්ධනය සඳහා ණය පහසුකම් ලබාදීමේදී පහත කොන්දේසි යටතේ ක්‍රියාකල යුතු වේ.

2.3.1 පැල 100,000 ක තවානක් සඳහා උපරිම ණය සීමාව රු2,000,000/= කි.

2.3.2 ණය ඉල්ලුම්කරු වානිජ තේ තවාන් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචිය ලබාගත යුතුය.

2.3.3 ණය වාරික ගෙවීම තවාන් කුටීරය සැකසීම හා රිකිලි සිටුවීම යන අවස්ථාවලදී සිදු කරනු ලැබේ.

2.3.4 ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රමිතිගත තේ පැල තවාන් ව්‍යාපෘතිය යටතේ සහනාධාර ලබා ගෙන ඇත්නම් එම සහනාධාර මුදල අඩු කොට ඉතිරි මුදල ණය ලෙස ලබා ගත හැක.

2.3.5. සම්පූර්ණ ණය මුදල කොටස් 02 කින් නිදහස් කරනු ඇත.

පළමු වාරිකය - ණය අයදුම්පත් වාර්තාව අනුමත කළ පසු

දෙවන වාරිකය- තවාන් ආකෘතිය සකසා තේ රිකිලි තවාන් මළු වල ස්ථාපනය කිරීමෙන් පසු

උදා -: සහනාධාර යටතේ ලක්ෂ 15 ක් ලබාගත් විට ඊට අමතර ලක්ෂ 05 ක මුදලක් තේ පැල තවාන් සඳහා ලබාගත හැක.

2.4. තේ ඉඩම් වල ජල සම්පාදන ක්‍රම ස්ථාපිත කිරීම සඳහා ණය පහසුකම් ලබාදීම.

තේ ඉඩම්වල ජල සම්පාදන ක්‍රම ස්ථාපිත කිරීම සඳහා ණය පහසුකම් ලබා දීමේ දී උපරිම ණය සීමාව හෙක්ටයාරයකට රු.800,000 කි. මෙම ණය පහසුකම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ව්‍යාපෘති නිර්දේශ කිරීමේදී පහත නිර්ණායක උපයෝගී කරගනිමින් නිර්දේශ ලබා දිය යුතුය.

- තේ වගාව ඵලදායී වගාවක් විය යුතුය.
- තේ වගා භූමියට ජල මූලාශ්‍ර පැවතීම හා එම මූලාශ්‍රවල ජල ධාරිතාවය වගාවේ ජල අවශ්‍යතාවයට ප්‍රමාණවත් බව තහවුරු කල යුතුය.

ඉහත නිර්ණායකයන්ට අනුකූලව තේ උපදේශක පරීක්ෂක වරුන්ගේ නිර්දේශය හා ප්‍රාදේශීය සහකාර තේ කොමසාරිස්වරුන්ගේ අනුමැතිය මත මුළු ණය මුදල එකවර නිදහස් කරනු ලැබේ.

2.5. තේ වගාවේ ක්‍රියාකාරකම් යාන්ත්‍රිකරණය සඳහා යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම සඳහා ණය පහසුකම් ලබා දීම.

- උපරිම ණය මුදල රු 500,000 කි.

- තේ වගාවේ දළු කැඩීමේ යන්ත්‍ර, වලවල් හෑරීමේ යන්ත්‍ර ,කප්පාදු යන්ත්‍ර ඇතුළු ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය විසින් නිර්දේශ කරනු ලබන තේ වගා යාන්ත්‍රිකරණයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා ණය පහසුකම් ලබා ගත හැක.

- ණය මුදල නිකුත් කිරීම ව්‍යාපෘති වාර්තා අනුමත කිරීමෙන් පසු එකවර නිදහස් කරනු ලැබේ.

ඒ අනුව ඔබගේ තේ ඉඩම සංවර්ධනය කර ගැනීම සඳහා ඉහත යෝජනා ක්‍රමය යටතේ අයදුම් කිරීමට හැකි අතර සෑම තේ ඉඩමක්ම 1957 අංක 51 දරණ තේ පාලන පනතේ අංක 02 වගන්තිය යටතේ ලියාපදිංචි කළ යුතු වේ. මේ වනතෙක් ලියාපදිංචි වී නොමැති නම් ඔබ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයට අදාල සහකාර තේ කොමසාරිස් කොට්ඨාශය වෙතින් හෝ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වෙබ් අඩවිය වන www.srilankateaboard.lk වෙතින් අදාල ඉල්ලුම්පත්‍ර ලබා ගෙන ග්‍රාම නිලධාරි නිර්දේශ සහිතව ප්‍රාදේශිය කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතුය. සහනාධාර ණය ක්‍රමය ලබා ගැනීම සඳහා ඔබ ගනුදෙනු කරන ඉහත 1.6 යටතේ සඳහන් මූල්‍ය ආයතනය හරහා අදාල ඉල්ලීම ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

ඉහත ඉල්ලුම්පත් අදාල මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත යොමු කරන අතර අදාල නිර්දේශ ඔබටද පිටපතක් සහිතව එම මූල්‍ය ආයතනය වෙත යොමු කරනු ලැබේ.

**ජයන්ත එදිරිසිංහ**
තේ කොමසාරිස්

**පිටපත් :**

1.) ලේකම් - වැවිලි අමාත්‍යාංශය
2.) ලේකම් - සමාගම් වතු ප්‍රතිසංස්කරණ ,තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා හා කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
3.) සභාපති - ශ්‍රී ලංකා තේ මණ්ඩලය
4.) සභාපති - මධ්‍ය පරිමාණ වැවිලි කරුවන්ගේ සංගම්
5) අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා තේ මණ්ඩලය
6). නියෝජ්‍ය තේ කොමසාරිස්-අපනයන/නියාමන/සංවර්ධන
7.) අභ්‍යන්තර විගණක
8.) සහකාර තේ කොමසාරිස්
- ගාල්ල/මාතර/රත්නපුර/බදුරලිය/ගම්පොළ/බණ්ඩාරවෙළ/ නුවරඑළිය
9.) ප්‍රාදේශිය තේ සංවර්ධන නිලධාරීන්
- ගාල්ල/මාතර/රත්නපුර/බදුරලිය/ගම්පොළ/බණ්ඩාරවෙළ/නුවරඑළිය
10.) සියලුම තේ උපදේශක/පරීක්ෂක වරුන්